FACULTY OF GRADUATE STUDIES
RECEIVED
14 DEC 2013
UNIVERSITY OF KELANIYA

# ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

ඒ. එස්. රූබසිංහ

**FGS/L/MSSc/2007/017**

ප්‍රවේශ අංකය: 857
වර්ග අංකය:

කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජීය විද්‍යා පීඨයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව පිළිබඳ සමාජීය විද්‍යාපති පර්යේෂණ උපාධිය සඳහා ඉදිරිපත් කරනලදී.

2012 අගෝස්තු

## නිබන්ධන සාරාංශය


ග්‍රන්ථ ප්‍රකාශනය යනුවෙන් අදහස් කරන්නේ අත්පිටපතක් ලිවීමේ කාර්යයේ සිට එය අවසන් උපයෝජකයාගේ භාවිතය සඳහා සුදුසු අන්දමින් සකස් කිරීම සඳහා වන සියලුම කාර්යයන් වේ. ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශනය වර්තමානය වනවිට හුදු වාණිජමය කටයුත්තක් වශයෙන් ක්‍රියාත්මක වුවද ප්‍රකාශන කර්මාන්තයේ අතීතය පිළිබඳ විමසිලිමත් වීමෙදී පැහැදිලි වන්නේ එය හුදෙක්ම සමාජයේ යහපත උදෙසා වාණිජමය පරමාර්ථයෙන් තොරව ක්‍රියාත්මක වූවක් බවයි. පිං රැස්කිරීමේ පරමාර්ථයෙන් ග්‍රන්ථකරණයට පිවිසීම තුළින් ඒ බව මනාව පැහැදිලි වේ.

මේ පර්යේෂණ නිබන්ධයෙහි මූලික අරමුණ වන්නේ අනුරාධපුර යුගයේ සිට කොළඹ යුගය දක්වා ශ්‍රී ලංකාවේ ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයේ ඓතිහාසික තත්ත්වය ඉදිරිපත් කිරීමයි.

ඓතිහාසික මූලාශ්‍ර හා වෙනත් ද්විතීයික මූලාශ්‍රවලින් පර්යේෂණයට අදාළ දත්ත රැස් කරන ලද අතර ඓතිහාසික විශ්ලේෂණ විධික්‍රමයෙන් දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී.

පර්යේෂණයෙන් බැස ගන්නා ලද නිගමනයන් මෙසේය: ශ්‍රී ලංකාවේ අතීත ග්‍රන්ථ ප්‍රකාශන කර්මාන්තයේ මුල් බීජ දක්නට ලැබෙන්නේ මුඛපරම්පරාගත ඥාන සමුච්චය තුළය. එමෙන්ම මෙරට අත් පිටපත් ග්‍රන්ථ ප්‍රකාශනය සිදු වූයේ පුස්කොළ ලේඛන කලාවක් මඟිනි. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමත් සමඟම මෙකී සම්ප්‍රදාය තහවුරු වූවාසේම එතෙක් පැවති මුඛභාෂිත ක්‍රමය වෙනුවට ස්ථිරසාර ලේඛන සම්ප්‍රදායක් ආරම්භ විය.

ග්‍රන්ථ රචකයෝ බොහෝ විට ධර්මධරයෝ වූහ. ඔවුන්ගේ අත් පිටපත්, සෙසු පිටපත්කරුවන් විසින් පිටපත් කොට දිවයින පුරා බෙදා හරින ලදී. මේ කාර්යය සඳහා රාජ රාජ මහාමාත්‍යාදීන් මෙන්ම අවශේෂ පොදු ජනතාව විසින් ද අනුග්‍රහය සපයන ලදී. පිටපත්කරුවන් විසින් සිදු කරන ලද්දේ වත්මන් මුද්‍රණ කරුවන්ට සමාන කාර්යයකි. අනුග්‍රාහකයන්ගේ කාර්යය වත්මන් ප්‍රකාශකයන්ගේ කාර්යයට සමාන විය.

ලේඛනය, පිටපත්කරණය හා බෙදා හැරීම යන ප්‍රකාශනයට ආවේණික මූලික ලක්ෂණ මෙරට අතීත ග්‍රන්ථ සම්ප්‍රදායේ ද දක්නට ඇති බව මේ පර්යේෂණයේදී තහවුරු විය.